# පුංචි ගස සහ පුංචි කෙල්ලී



දනනි හස්මිනී අබේකෝන්

# පුංචි ගස සහ පුංචි කුෝවී

ප්‍රථම එළිදැක්වීම - 15.11.2023
ISBN : 978-624-208-103-8

කතෘගේ වෙනත් කෘති : මැජික් යෂ්ඨිය

දනනි හස්මිණී අබේකෝන්

# පිදුම

දෙව් ලොව ගිය ලොකු අත්තාටත්
ආදරෙන් මාව බලන මගේ
අත්තම්මාටත්,
මා කියන හැමදේම කරන
මාගේ අනිත් (අරුප්පල) අත්තම්මාටත්
ආදරෙන් ....

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.


මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
**විදුහල්පතිනිය**
**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**
**2023.11.01**

# පුංචි ගස සහ පුංචි ක්‍රෝචී



ඔන්න එකමත් එක කාලෙක පුංචි ළමයෙක් උපන්නා. ඒ ළමයාගේ නම තමයි ක්‍රෝචී. ඉතින් ඒ ළමයා ටිකෙන් ටික ලොකු වුණා.



දැන් එයා පෙර පාසලටත් යනවා පුංචි ක්‍රෝචි පෙරපාසල් ගිහින් ගස් ගැන, සත්තු ගැන, ඉගෙන ගත්තා.



එක දවසක් පුංචි ක්‍රෝවීගේ අම්මා එයාට ඇපල් අරන් දුන්නා.



එයා ඒවා කාලා ඒ ඇට පැළ කළා,
එයා වගේම පුංචි පෝච්චියක



ඊට පස්සේ ඒ පැළේ එන්න එන්ම ලොකු  වුණා පුංචි ක්‍රෝවීත් එක්කම එයාගේ උසටම පැළෙත් හැදුණා.

එයා ඇපල් පැළේ පෝච්චියෙන් අරන් බිම පැළ කළා. දැන් අම්මාටයි, පුංචි ක්‍රෝවීටයි පුංචි ගසටයි ගොඩාක් සතුටුයි.





හැබැයි ටික කාලෙකින් වෙච්ච දේ ගැනනම් හරිම දුකයි මොකද කිව්වොත් ඒ ගස ටික ටික වේලෙන්න වුණා. කොයිතරම් සාත්තු කළත් වැඩක් වුණේ නෑ දැන් අම්මාටයි පුංචි ක්‍රොව්ටයි ගොඩක් දුකයි. අව්ව වැඩි නිසා පොළව වේලිලා.



අම්මයි ක්‍රෝවීයි දවස් කිහිපයකට ආච්චිලාගේ ගෙදර ගියා. ගිහින් එද්දී ඇපල් ගහ මැරිලා.පුචි ක්‍රෝවී හුගක් ඇඬුවා.



කලකට පස්සේ ක්‍රෝවී ඇපල් කාලා ඇට ගොඩක් පැළ කළා. දැන් ක්‍රෝවීට වයස 11යි. එක දවසක් එයා බලනකොට පුංචි පැළයක් දැක්කා. ඒ ඇපල්.



ක්‍රෝවීට හරිම සතුටුයි එයා දුවගෙන ගිහින් අම්මාටත් කිව්වා දැන් තියෙන්නේ ඇපල් ගහ ලොකු වෙනකල් සාත්තු කරන්න, ආදරෙන් බලා කියාගන්න. දැන් ඇපල් ගහට අවුරුදු දෙකයි.

ඉතින් ක්‍රෝවීටයි අම්මටයි තියෙන්නේ දැන් මේ ඇපල් කන්නයි. මේ කාලය වෙන කොට ක්‍රෝවීට අලුත් නංගි බබෙකුත් ලැබී තිබුණා. එයාගේ නම රුසී, ක්‍රෝවී එයාට හරිම ආදරෙයි.





එයා හැමදාම නංගි බබාව ඇපල් ගහ ළඟට ගෙනියනවා සෙල්ලම් කරන්න. ඒ හැමදාම එයා නංගිට අවවාදයකුත් දෙනවා ආදරෙන්.

"මතක තියාගන්න අපි හැම වෙලේම ගස් ආරක්ෂා කරන්න ඕන. එතකොට තමයි එයාලාත් අපිව ආරක්ෂා කරන්නේ."



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

**මෙයට**
**සෙනෙවිරත්න මහලේකම්**
**පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක**
**2023.11.01**